# ශ්‍රී ලංකාවේ 2019 ජනාධිපතිවරණ ප්‍රචාරණය තුළ බෞද්ධ භික්ෂුවගේ භූමිකාව

කේ. එච්. හසිතා ස්වර්ණමාලි[1], බී. ජී. ඉමේෂා මධුවන්ති[2]

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසය තුළ භික්ෂුවගේ භූමිකාවට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. මෙම භූමිකාව එක් එක් මැතිවරණයන්හි දී කාලානුරූපී ව වෙනස්කම්වලට ලක් වී තිබේ. ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ ඉතිහාසයේ සිට වර්තමානය දක්වා කාලවකවානුව පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී භික්ෂු සමාජය හා පාලන තන්ත්‍රය අතර යම් සබඳතාවක් වූ බව සඳහන් කළ හැකි ය. 1946 පෙබරවාරි 13 දින විද්‍යාලඞ්කාර ප්‍රකාශනය මඟින් භික්ෂුව සඳහා දේශපාලනය කැපය යන මතවාදය ඉදිරියට පැමිණීමත් සමඟ භික්ෂූන්ට දේශපාලනය සඳහා විවෘත වේදිකාවක් නිර්මාණය විය.

1931 දී මෙරටට සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීමේ සිට මුල් කාලීන ව මැතිවරණ දේශපාලනය තුළ භික්ෂුවගේ භූමිකාව සහය පළ කිරීම් මත පදනම් විය. "1947 වසරේ දී පැවැත් වූ මැතිවරණයේ දී ලංකා සමසමාජ පක්ෂයේ අපේක්ෂකයින් ජයග්‍රහණය කරවීම උදෙසා භික්ෂූන් ප්‍රමුඛ ව කටයුතු කරන ලදී." (Dharmadasa,1997;244). තව ද, 1956 වසරේ දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කරවීමෙහි ලා ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය ප්‍රමුඛ විය.

2004 වර්ෂයෙන් පසු භික්ෂු දේශපාලන පක්ෂයක් ලෙස ජාතික හෙළ උරුමය පිහිටුවා ගැනීමෙන් පසු මැතිවරණ දේශපාලනය තුළ භික්ෂූන් ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන්නට විය. තව ද භික්ෂුව සමාජ සංවිධාන හරහා ප්‍රබල ලෙස දේශපාලන කරළියට පැමිණෙන්නට විය. මේ අනුව පැහැදිලි වූයේ අතීතයේ පටන් භික්ෂුව සහ මැතිවරණ දේශපාලනය අතර ඉතා සමීප සබඳතාවක් ගොඩ නැඟී තවදුරටත් එය වර්ධනය වෙමින් පවතින බව යි.

2019 වර්ෂයේ දී මෙම සබඳතාවේ කැපී පෙනෙන වර්ධනයක් සිදු විය. හත්වන විධායක ජනාධිපති තෝරනු ලැබූ ජනාධිපතිවරණ කාලවකවානුව තුළ මේ බව වඩාත් පැහැදිලිව ඉස්මතු ව පෙනුණි. භික්ෂූන් ජනතාවගේ චාරණයට බලපෑම් කිරීමට හැකි වන ආකාරයේ මැතිවරණ ප්‍රචාරණ ක්‍රියාවලියක නිරත වී සිටිනු දැකගත හැකි විය. මෙම පර්යේෂණය මඟින් උත්සාහ කරනුයේ භික්ෂුව මැතිවරණ දේශපාලනය තුළ ඡන්දය ප්‍රකාශ කිරීම, අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වීම, සම්පත් දායකයන් ලෙස ක්‍රියා කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම නො ව 2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් බෞද්ධ භික්ෂුවගේ භූමිකාව පෙර නො වූ විරූ පරිදි වර්ධනය වී ඇත්තේ ඇයි සහ ඊට බලපාන ලද හේතුසාධක විමර්ශනය කිරීම යි.

[1]. සහාය කථිකාචාර්ය, දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. *hasitha.swa@gmail.com*
[2]. සහාය කථිකාචාර්ය, දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**පර්යේෂණ අරමුණු**

- ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසය තුළ බෞද්ධ භික්ෂුවගේ භූමිකාව කාලානුරූපී ව වෙනස් වූ ආකාරය හඳුනා ගැනීම
- 2019 ජනාධිපතිවරණය හා ඒ තුළ බෞද්ධ භික්ෂුවගේ භූමිකාව හඳුනා ගැනීම
- 2019 ජනාධිපතිවරණය තුළ පෙර නො වූ විරූ පරිදි බෞද්ධ භික්ෂූන් මැතිවරණ ප්‍රචාරණයට සක්‍රීය ලෙස සම්බන්ධ වීමට බලපානු ලැබූ හේතු විමසා බැලීම
- 2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතු උදෙසා භික්ෂුව අවතීර්ණවීම හේතුවෙන් ඇති වූ බලපෑම් සහගත තත්ත්වය අවබෝධ කර ගැනීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය උදෙසා දත්ත රැස් කිරීම ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතියික දත්ත මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදු කරනු ලැබී ය. ප්‍රාථමික දත්ත ව්‍යූහගත නො වන සම්මුඛ සාකච්ඡා මඟින් ද, ද්විතියික දත්ත ග්‍රන්ථ, ලිපිලේඛන, පුවත්පත්, සඟරා, පූර්ව පර්යේෂණ සහ  අන්තර්ජාලය මෙන් ම ජනමාධ්‍ය ප්‍රවෘත්ති සාකච්ඡා තොරතුරු ආශ්‍රයෙන් රැස් කරනු ලැබී ය. එලෙස රැස් කරගත් ගුණාත්මක දත්ත තේමාකරණය ඔස්සේ විශ්ලේෂණාත්මක සහ විස්තරාත්මක විධික්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කර තිබේ.

**පර්යේෂණ ගැටලුව**

2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ ක්‍රියාවලිය තුළ බෞද්ධ භික්ෂූන්ගේ භූමිකාව පෙර නො වූ විරූ පරිදි වර්ධනය වී පවතින්නේ ඇයි? සහ ඒ කෙරෙහි බලපාන ලද හේතුසාධක මොනවා ද?

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

**වල්පොල රාහුල හිමියන්** විසින් 1946 දී රචනා කරන ලද **භික්ෂුවකගේ උරුමය** නමැති කෘතිය තුළින් දේශපාලනය සඞ්ඝ සමාජයට අකැප දෙයක් නො වන බව පෙන්වා දෙයි. එය සඞ්ඝයා සතු සමාජ වගකීමක් බව ද ඓතිහාසික භික්ෂු සමාජය සහ රාජ්‍ය අතර, පැවති අවියෝජනීය සබඳතාව සහ යටත්විජිත යුගය තුළ රාජ්‍යයත්වය, සංස්කෘතිය, ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කර ගැනීමෙහි ලා ඉටු කරන ලද පුරෝගාමී භික්ෂු මෙහෙවර පිළිබඳ වැඩිදුරටත් මෙම කෘතිය තුළින් ප්‍රකාශ වේ.

මහාචාර්ය **K.N.O. Dharmadasa** විසින් **1997** දී භික්ෂුව සහ ලංකා සමාජය නමැති ග්‍රන්ථයට රචනා කරන ලද **Buddhism And Politics In Modern Sri Lanka** නමැති ලිපිය තුළ 1930 දශකයේ සිට 1980 දශකය දක්වා කාල පරාසය තුළ භික්ෂුව දේශපාලනයට පිවිසුනු ආකාර පිළිබඳ ව සාකච්ඡා කරනු ලබයි.

**Vishaka S. Sooriybandara**ගේ **The Religious Ideology In Sri Lankan Politics: The Political Role Of Jathika Hela Urumaya (JHU)** දර්ශනපති නිබන්ධනය 2004 වර්ෂයේ සිට ක්‍රියාකාරී දේශපාලනයට ප්‍රවිෂ්ට වූ භික්ෂූන්ගේ ක්‍රියාකලාපය පදනම් කොට ගනිමින් සිදු කොට ඇත. ඒ අනුව ශ්‍රී ලාංකේය දේශපාලනයේ ආගමික දෘෂ්ටිය ජාතික හෙළ උරුමය පක්ෂයේ දේශපාලන භූමිකාව තුළින් පෙන්නුම් කර දී ඇත. ඒ අනුව ලංකාවේ ප්‍රධාන ධාරාවේ දේශපාලනය ආගමික දෘෂ්ටියක් මත පදනම් වූ අන්දම මෙමඟින් පෙන්වා දීමට උත්සාහ කොට ඇත.

**මහාචාර්ය ජයදේව උයන්ගොඩ** විසින් **2018** වර්ෂයේ දී රචිත "**භික්ෂූන් වහන්සේ සහ නව දක්ෂිණාංශික දේශපාලනය**" නමැති ලිපිය තුළ ශ්‍රී ලංකාවේ භික්ෂුව සහ දේශපාලනය පිළිබඳ ව විග්‍රහ කොට ඇත. මෙහි දී දේශපාලනය සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලා අතර පවතින ප්‍රවණතා කිහිපයක් පිළිබඳ ව අදහස් ඉදිරිපත් කොට ඇති අතර, විශේෂ අවධානයක් යොමු කොට ඇත්තේ භික්ෂූන්ගේ රැඩිකල් පැතිකඩ කෙරෙහි ය. මෙම භික්ෂූන් ශ්‍රී ලංකාවේ නව දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපෘතියක නියමුවන් ලෙස ඉදිරියට පැමිණ ඇති බව සඳහන් කොට ඇත. 2019 ජනාධිපතිවරණයෙන් පසු බෞද්ධ ඒකාධිපති පාලන තන්ත්‍රයක් සඳහා ලංකාවේ දේශපාලනය පරිවර්තනය විය හැකි බවත් පෙන්වා දී ඇත.

**පර්යේෂණ රාමුව**

මෙම පර්යේෂණය මඟින් අධ්‍යයනය කරනුයේ 2019 ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම සම්බන්ධයෙන් පමණි.

**පර්යේෂණ සාකච්ඡාව**

2019 ජනාධිපතිවරණයෙන් පසු මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති නිවේදනයක් නිකුත් කරමින් පෙන්වා දී තිබෙන්නේ මෙවර මැතිවරණයේ දී වැඩියෙන් ම මැතිවරණ නීති කැඩුවේ මාධ්‍ය ආයතන සහ ආගමික නායකයින් බව යි. Caffe සංවිධානය පෙන්වා දෙන පරිදි අනෙකුත් ජනාධිපතිවරණවලට සාපේක්ෂව පෝස්ටර් සහ කටවුට් භාවිතය අවම මට්ටමක තබා ගනිමින් 2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතු සිදු වී ඇත. නමුත් 2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතු උදෙසා ඉතිහාසයේ නො වූ විරූ අන්දමින් භික්ෂූන් මැදිහත් වීමේ ප්‍රවණතාවක් දැකගත හැකි විය.

ඒ අනුව මැතිවරණ වේදිකාවල කතා පැවැත්වීම, මාධ්‍ය සාකච්ඡා සහ මාධ්‍ය වැඩසටහන්වල අදහස් ඉදිරිපත් කිරීම, YouTube නාලිකා සහ Facebook Page නිර්මාණය කර ගනිමින් අදහස් දැක්වීම මෙන් ම ධර්මදේශනා මාර්ගයෙන් ද භික්ෂූහු 2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතුවල නිරත වූහ. ඒ අනුව 2019 ජනාධිපතිවරණය තුළ බෞද්ධ භික්ෂූන් මැතිවරණ ප්‍රචාරණයට සක්‍රීය ලෙස සම්බන්ධ වීමට බලපානු ලැබූ හේතු පහත පරිදි සඞ්ක්ෂිප්ත ව පෙන්වා දිය හැකි ය. භික්ෂූන් විසින් මැතිවරණ වේදිකාවල දැක් වූ අදහස්, මාධ්‍ය සාකච්ඡාවල සහ මාධ්‍ය වැඩසටහන්වල දැක් වූ අදහස් මෙන් ම ධර්මදේශනා ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ ප්‍රකාශ ආශ්‍රයෙන් එකී හේතුසාධක විමසා බලනු ලැබී ය.

භික්ෂූන් වහන්සේලාගේ ප්‍රකාශ තුළින් පැහැදිලි වූ කරුණක් වූයේ පසුගිය ආණ්ඩු සමය තුළ භික්ෂූන් නො සලකා හැරීමට ලක් වූ බවත් ඒ හේතුවෙන් ඊට එරෙහිව නැගී සිටින බලවේගයක් ලෙස උන්වහන්සේලා ක්‍රියාත්මක වූ බවත් ය. අතීතයේ පටන් සමාජය තුළ භික්ෂූන් වහන්සේලාට පැවති ප්‍රමුඛතාව ඛණ්ඩනය වූ සෑම අවස්ථාවක ම ඊට එරෙහි බලවේගයක් ලෙස භික්ෂූන් මැතිවරණ දේශපාලනය ආශ්‍රයෙන් නැගී සිටි බවට උදාහරණ ලංකාවේ මැතිවරණ ඉතිහාසය තුළ පවතී. භික්ෂූන් මෙම ආකල්පයෙන් පසු වීම අතීත අනුවේදනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සිදු වී ඇති බව පැහැදිලි වේ.

එසේ ම 2019 ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතුවල දී භික්ෂූන් ක්‍රියාකාරී භූමිකාවක නිරතවීමට බලපාන ලද ආසන්නතම හේතුව පාස්කු ඉරිදා ප්‍රහාරය යි. බෞද්ධ මූලධර්මවාදය, අවිහිංසාවාදය, නම්‍යශීලීත්වය, වැනි නවීකාරක ගුණයන්ගෙන් සමන්විත වේ. ඇෆ්ගනිස්ථානය, පාකිස්ථානය, බංගලාදේශය, ඉන්දුනීසියාව හා මැලේසියාව වැනි රටවල බුදුදහම දුර්වල වූයේ ප්‍රචණ්ඩකාරී ආගම්වලට අවිහිංසාවාදයෙන් පිළිතුරු දීමට යාමෙනි. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ඇතැම් භික්ෂූන් අවිහිංසාවාදය පසෙක තබා ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන අන්දම දැකගත හැකි ය.

පාස්කු ප්‍රහාරයෙන් පසු රට පුරා නිර්මාණය වූ අර්බුදකාරී වාතාවරණය තුළ මුස්ලිම් පල්ලිවලින් කඩු කිණිසි සොයා ගැනීම, දොස්තර සාෆි සම්බන්ධ සිද්ධිය, මඩකලපුව ශරියා විශ්වවිද්‍යාලය, ඇතැම් ප්‍රදේශවලින් වඳපෙති සොයා ගැනීම, මාවනැල්ල හා ත්‍රිකුණාමලය ප්‍රදේශවල බුදුපිළිමවලට හානි සිදු කිරීම ආදී සිද්ධි ද භික්ෂූන් ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතුවලට සක්‍රීය ලෙස සම්බන්ධ වීමට හේතු විය. එසේ ම බෞද්ධ සමාජ සංවිධානවල ක්‍රියාකාරීත්වය ද 2019 ජනාධිපතිවරණයේ ප්‍රධාන සාධකයක් විය. බොදු බල සේනා, රාවණා බලය වැනි බෞද්ධ සංවිධාන සිංහල බෞද්ධ බහුතරයේ ආකර්ෂණය දිනා ගනිමින් ජනාධිපතිවරණ සමයේ ජනතාවගේ මතයට බලපෑම් එල්ල කරන ලදී.

එසේ ම 2019 ජනාධිපතිවරණයට භික්ෂූන් සම්බන්ධ වීමට බලපාන ලද හේතූන් අතර, සිංහල-බෞද්ධ විඥානයේ පවතින බෞද්ධ ඒකාධිපති පාලකයෙකු පිළිබඳ සිහිනය ද බලපා තිබේ. මැතිවරණ දේශපාලනයට ප්‍රවිෂ්ට වූ සියලු භික්ෂූන්ගේ ස්වරූපය භීතිය සහ වීරත්වය එකට කැටි වූ රැඩිකල් ස්වරූපයක් බව පැහැදිලි වේ. අවිහිංසාවාදී මාර්ගයක සිටින භික්ෂුව මෙලෙස ක්‍රියාකාරී දේශපාලනයට ප්‍රවිෂ්ටවීම තුළින් සිදු වන්නේ පටු ජාතිවාදී, ආගම්වාදී හැඟීම් ඉස්මතුවීමකි. ඉස්ලාම් මූලධර්මවාදය වැනි භයානක අභියෝගවලට බුදුදහමේ පවතින අවිහිංසාවාදීභාවයෙන් පිළිතුරු දීමේ නො හැකියාව මෙයට ප්‍රධාන හේතුවක් ලෙස පෙන්වා දිය හැකි ය.

**පර්යේෂණ නිගමනය**

2019 ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතුවල නිරතවූ භික්ෂූන්ගේ ක්‍රියාකලාපය, අවිහිංසාවාදී බුදුදහම තුළ අධිකාරීවාදී අනුගාමිකයන් පිරිසක් නිර්මාණය වීමෙහි ලා බලපා ඇත. මෙහි සමස්ත ප්‍රතිඵලය වූයේ ප්‍රජාතන්ත්‍රවාදයට බලපෑම් එල්ල වීම, ජනවාර්ගික ජාතිකවාදය ඉස්මතු වීම, ජාතික නායකත්වයක් වෙනුවට ජනවාර්ගික පදනමකින් යුතු නායකයෙකු නිර්මාණය වීම ආදී ගැටලු සමූහයක් නිර්මාණය වීම

යි. ඒ අනුව සිදු විය යුත්තේ භික්ෂුව ප්‍රධාන ප්‍රවාහයේ දේශපාලනයට මාර්ගෝපදේශ සැපයීම මිස ක්‍රියාකාරී දේශපාලනයට ප්‍රවිෂ්ට නො වීම යි.

**ප්‍රමුඛ පදඃ** භික්ෂුව, දේශපාලනය, මැතිවරණය, මූලධර්මවාදය, භූමිකාව

මූලාශ්‍රය


- වජිරසීහ, කඹුරුගමුවේ (2007). **භික්ෂුව, විනය සහ දේශපාලනය.** කර්තෘ ප්‍රකාශනයකි.
- ගුණවර්ධන, රණවීර (1993). **සිවුර සහ නගුල.** කොළඹ.
- සිල්වා, නලින් (2004). **මැතිවරණය සහ හාමුදුරුවෝ.** මහරගමඃ චින්තන පර්ෂද ප්‍රකාශකයෝ.
- සොයිසා, ඒ.පී. (1947). **සඞ්ඝරත්නය නම් වූ දේශපාලන භික්ෂුව.** කොළඹ.
- ප්‍රනාන්දු, ලක්සිරි (1974). **ජාතික ව්‍යාපාරය ව්‍යවස්ථා වර්ධනය සහ වාමාංශික ව්‍යාපාරයේ උපත.** නුගේගොඩඃ දීපානි ප්‍රකාශකයෝ.
- මලල්ගොඩ, බන්දුතිලක (2002). **ශ්‍රී ලංකාවේ මැතිවරණ පුරාණය.** කොළඹඃ ශේශා එන්ටර්ප්‍රයිසස්.
- රාහුල, වල්පොළ (1946). **භික්ෂුවගේ උරුමය.** කොළඹඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
- රුහුණේ, නන්දිමිත්‍ර (1947). **දේශපාලන භික්ෂූන්ට.** කොළඹඃ ස්වස්තික මුද්‍රණාලය.
- උයන්ගොඩ, ජයදේව. "භික්ෂූන් වහන්සේ සහ නව දක්ෂිණාංශික දේශපාලනය". **අනිද්දා.** ජූලි 2018.
- ගුණසිංහ, නිවුටන්. "සඞ්ඝයාගේ සඞ්කේතාත්මක භූමිකාව", **ප්‍රවාද.** අප්‍රේල් 2000.
- ජයවර්ධන, කුමාරි. "බෞද්ධ විඥානය හා ජනවාර්ගික ප්‍රශ්නය. **ප්‍රවාද.** අප්‍රේල් - දෙසැම්බර් 2000.
- දේවසිරි, නිර්මාල් රංජිත්. "හෙළ උරුමයේ ඉරණම සිංහල බෞද්ධයාගේ අර්බුදය හා සමස්ත භික්ෂු නායකත්වයේ වගකීම, **බලය.** අප්‍රේල් 2004
- සෙනෙවිරත්න, එච්. එල්. "**බුද්ධාගම සඞ්ඝයා සහ සිවිල් සමාජය". ප්‍රවාද.** ජනවාරි- මාර්තු, 2001.
- Kemper, Stevan (1978). **Buddhism without Bhikkhus.** The Sri Lanka Vinaya wardhana society. Religion and the Legitimation of power in Sri Lanka(ed.). Bardwell Smith. Chamberbury: Anima Books.
- Malalgoda, Kithsiri (1976). **Buddhism in Sinhalese Society 1760-1900:** A Study of Religious Revival and Change. Califoniya Press.
- Obesekara, Gananatha (1970). **Buddhism and Society: A great Tradition and its Burmese Vicissitudes**. Newyork: Haper & Row.
- Pandnis, Urmila (1976). **Religion and Politics in Sri Lanka.** NewDelhi: Manohar.
- Thambaiah, S.J. (1992)' **Buddhism Betrayed, Religion, Politics and Violence in Sri Lanka.** London: Chicago Press.
- Weerawardana, I.D.S. (1951) .**Government and politics in Ceylon 1931- 1946**.Colombo: Ceylon Economics research association.
- Weerawardana I.D.S. (1960). **Ceylon General Election 1956.** Colombo: M.D. Gunasena & Co.Ltd.
- https://**www.colombotelegraph.com** › naveendra-p-de-zoysa-17-june-2018
- https://**janathamathaya.com** › Editor's Choice
- https://**www.bbc.com** › sinhala › world-47059349
- https://lankafirstnews.lk ›

- **www.silumina.lk** ›
- **www.divaina.com** ›
- https://**dharmanidhaana.wordpress.com** › category ›
- https://**www.anidda.lk** ›
- https://**www.xnews.asia** › Local
- https://**ravaya.lk** ›
- https://**www.hirunews.lk**
- https://**www.newsfirst.lk**
- **www.YouTube.com**